කෘතගුණ දක්වන අපේ දරුවෝ

බුදු පියාණන්වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව කළ ප්‍රථම කාර්යය වූයේ බුද්ධත්වයට පත්වන අවස්ථාවේ තමාට පිටදුන් බෝගස දෙස නෙත් නොහෙලා බලා සිටීමෙන් සිය කෘතඥතාව ඒ බෝගස වෙත පළකිරීමයි. ජේරාදෙණිය සරසවියේ විද්‍යාර්ථයින්ගේද දරු දැරියෝ තම දෙමාපියන් උගත් විශ්ව විද්‍යාලයට කෘතගුණ දැක්වීමේ උසස් කාර්යයක් වසර කීපයක සිට කරගෙන යති. මේ සඳහා ඔවුන් තෝරාගත්තේ පියවරුන්ගේ දිනයයි. එදිනට සාමාන්‍යයෙන් තම පියාට තෑග්ගක් ප්‍රදානය කිරීම හෝ කෑමකට එක්කරගෙන යාම බටහිර රටවල සිරිතක්ව පවතී. අප දරුවන් මෙය වෙනස් කරමින් මෙම මුදල තම දෙමාපියන් ඉගෙනගත් සරසවියේ ආර්ථික පීඩා විඳින ශිෂ්‍යයෙකුට දීමට යෝජනා කිරීම කෘතගුණ සැලකීම වැනි උසස් ගුණයන් අහෝසි වෙමින් පවතින යුගයක හැමදෙනටම පෙන් වූ ආදර්ශයකි.

මෙම උසස් ක්‍රියාවලිය පටන්ගත් ආකාරය හැඟීම්බර, රසවත් කථාවකි. සිසිර සෘතුවේ එක් සීතල සැදෑවක ජේරාදෙණිය සරසවියේ මිතුරු මිතුරියන් පිරිසක් එකතු වී කෝපි කෝප්පයක රස විඳින අතර තමන් මල්බර යොවුන් වියේ සරසවියේ ගතකළ සොඳුරු කාලය ගැන කථා කළේ එම කාලය තුළ ලැබූ අත්දැකීම් ආවර්ජනය කරමිනි. ඔවුන් එම කාලය තුළ භුක්ති වින්ද සුඛෝපභෝගී නේවාසික පහසුකම් සහ රස නහර පිනවූ ආහාර පාන පිළිබඳව ආනන්දයෙන් කථා කිරීමටද ඔවුහු මෙහිදී

සරසවිය නැරඹීමට මෑතකදී ගිය මිතුරෙක් මෙහිදී ප්‍රකාශ කළේ එම ස්වර්ණමය යුගය දැන් මුළුමනින්ම උඩු යටිකුරු වී ඇති බවයි. වත්මන් සරසවි ශිෂ්‍යයින්ට එදා ආහාර වේල සපයා ගැනීමත් විශාල ප්‍රශ්නයක් වී ඇති බවයි. එදා කුමාර ලීලාවෙන් මේසයට බෙදන ලද මස්, මාළු සහිත ප්‍රනීත ආහාර බුදින්නට සරසවි සිසුන් වරම් ලැබූවත් අද ඔවුන් තම කාමරය තුළම යමක් රත්කරගෙන වේල පිරිමසා ගන්නා බවත් තවත් සමහරෙකු ආපන ශාලාවෙන් එක ආහාර වේලක් ලබාගෙන එය භුක්ති විඳ අවසානයේ තම ඉඳුල් පිඟාන මිතුරෙකුට 'අඩු' ලබා ගැනීමට දීමෙන් ඔහුගේ කුස පුරවන බවත් ය. මෙම තොරතුරු හැම දෙනාගේම හද කම්පාවට ලක් කෙරුණි.

තරමක නිහැඬියාවකින් පසු හැම දෙනාගේම ඒකමතික අදහස වූයේ කෙසේ හෝ මේ දරුවන්ට හැකි අයුරින් උදව් කළ යුතු බවයි. මේ වන විටත් පුද්ගලික මට්ටමින් දරුවන්ට උදව් කරන පිරිසක් මේ සඳහා ප්‍රමුඛතාවය දීමට එකඟ විය. ඊළඟ භාරදූර ප්‍රකාශනය වූයේ මේ සඳහා මුදල් එකතු කරන්නේ කෙසේ කවදා කොතැනකදී ද සහ කුමන තේමාවක් මත මෙය කළ යුතුද යන්නයි. මෙම සුහද පිළිසඳර අවසන් වූයේ කුමන ආකාරයකින් හෝ අපේ දූ දරුවන්ද මේ සඳහා එකතු කරගත යුතුයි යන වටිනා අදහසත් සමඟය.

දෙවන සාකච්ඡා වටයට ජේරාදෙණි සරසවියේ විද්‍යාර්ථීන්ගේ සංගමයේ වික්ටෝරියානු ශාඛාවේ :ඡඹ්ඩසප්* සාමාජිකයින් කිහිප දෙනෙකුගේ දරුවන්ද සහභාගී කරගැනීමට තරම් අපි වාසනාවන්ත වුනෙමු. දෙමාපියන්ගේ අදහස් දරුවන්ට ඉදිරිපත් කර මේ සඳහා ඔවුන්ගේ අදහස් දක්වන ලෙස වැඩිහිටියන් ඉල්ලා සිටියහ. වැඩිහිටි හැම උද්දාමයට ලක් කරමින් ඒ සුන්දර සැන්දෑවේ ජේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන්ම දොරට වැඩි විද්වතුන් යුවලකගේ දියණියක් කාලෝචිත යෝජනාවක් කළේ දෙමාපියන්ගේ ඇස්වලට කඳුළු නංවමිනි.
එම දියණියගේ අදහස වූයේ පියවරුන්ගේ දිනයට තෑගි ගැනීමට හෝ කෑමකට පිටතට යාමට කරන වියදම සරසවි දරු දැරියන්ට ශිෂ්‍යත්ව දීමට අරමුදලක් පටන් ගැනීමට යොදාගැනීම සුදුසු බවකි. ඒ සාකච්ඡාවට සහභාගී වූ දරු දැරියන්ගේ අදහස් වූයේ ''අපේ දෙමාපියන්ට හැමදේම දැන් තියෙනවා. ඒක නිසා මේ වගේ උතුම් වැඩකට ඒ මුදල් යොදාගැනීම භෞතික තෑග්ගක් ලැබෙනවාට වඩා අපේ දෙමාපියන් සතුටට පත්වේවි.'' යන්නයි. එම අදහස තවත් ප්‍රබල කිරීමට ඔවුන් ඉදිරිපත් කළ තව කරුණක් වූයේ ''අපේ දෙමාපියන් ලද ඒ උසස් අධ්‍යාපනය නිසයි මේ වගේ රටකට ඇවිත් අපට සැහැල්ලුවෙන් අධ්‍යාපනය ලැබීමටත් අනෙකුත් සැප පහසුකම් ලැබීමටත් අවස්ථාව ලැබුණේ.'' කියා දරුවන්ගේ ඒ කෘතඥතා ගුණය සහිත සිතුවිලි හැම දෙන තුළම ආඩම්බරයක් ඇති කළේය.

වික්ටෝරියාවේ වෙසෙන ජේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථයින්ගේ සංගමයේ සාමාජිකයින් 2012 සැප්තැම්බර් මස පියවරුන්ගේ දිනයේදී මෙහි ආරම්භක පියවර තැබීමට එකඟ විය. මෙහිදී අපට කඩුලු කිහිපයක් පැනීමට සිදුවිය. සංවිධායකයින්ගේ ඉලක්කය වූයේ අඩු තරමින් /5000 ක් වත් එදිනට එකතු කර ගැනීමයි. ඡඹ්ඩසප් වැඩි දෙනෙක් සහ ඒ අයගේ යහලු යෙහෙළියන් මෙදිනට සහභාගී විය. ඉලක්ක කරගත් මුදල එකතු කර ගැනීමට වැඩි වේලාවක් ගියේ නැත.

2012 එකතු කළ මුදලින් ශිෂ්‍යත්ව 56 ක් සරසවි සිසුන්ට ප්‍රදානය කිරීමට හැකි වීම ඡඹ්ඩසප් සාමාජිකයින්ගේ තවත් ජයග්‍රහණයක් ලෙව සනිටුහන් කළ හැකිය. මෙහිදී වැදගත් කරුණු කිහිපයක් ඉස්මතු කිරීම අපගේ යුතුකමක් යයි සලකමු.

ශිෂ්‍යත්ව සඳහා ආධාර ලෙස ලැබෙන හැම ඩොලරයක්ම සරසවි සිසුන්ට ලබාදෙන අතර කිසිම උත්සව කටයුත්තකට හෝ පරිපාලන කටයුත්තකට එම මුදල් භාවිතා නොකිරීම.

PUAAVic මගින් වාර්ෂිකව වෙන් කරන මුදලින් සහ සිය කැමැත්තෙන් ඉදිරිපත් වූ සරසවි විද්‍යාර්ථයින්ගේ පවුල් වල සහයෝගය ඇතිව පියවරුන්ගේ දිනයේ වියදම් පියවා ගැනීම.

දරු දැරියන් ප්‍රථම වතාවට විශාල වශයෙන් මුදල් පරිත්‍යාග කරමින් ශිෂ්‍යයාට ව්‍යාපෘතියට ආධාර කිරීම.

පළමු වසරේ සාර්ථකත්වයෙන් දිරිමත් වූ පිරිස ඊළඟ සැප්තැම්බරයේ ශිෂ්‍යත්ව 100 ක් සඳහා ඉලක්ක කරගැනීමට තීරණය කරන ලදී. මේ සඳහා PUAAVic මගින් වෙන් කරන ලද නොමසුරු ආධාර මුදල මෙම ඉලක්කය කරා යාමට ශක්තිමත් අඩිතාලමක් විය. කලින් වසරේ ලද අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් ඊට වඩා උත්කර්ෂවත් ලෙස දෙවන වසරේ උත්සවය පැවැත්වීමට අරමුණු කරගෙන ඊට අදාළ කටයුතු වල යෙදුනි.

2014 වසරේ තවත් සාර්ථක පියවරුන්ගේ දිනයක් පැවැත් වූ අතර මෙයින් ලැබූ ප්‍රතිචාරය ඉහත වසර දෙකටම වඩා වැඩිවිය. ඩොලරයේ අගය ? /* අවාසනාවන්ත ලෙස පහළ වැටී තිබුණද ශිෂ්‍යත්ව 136 ප්‍රදානනය කිරීම ඡඹ්ඩසප් සනිටුහන් කරනුයේ නිහතමානී සතුටකිනි.

2013 පියවරුන්ගේ දිනය

පියවරුන්ගේ දිනය වෙනුවෙන් අපේම දියණියක විසින් හැමගේම හදවත් තුළ රෝපණය කළ එම බීජය මල් ඵල දරණ තරුණ ශක්තිමත් වෘක්ෂයක් වේ යයි සමහර විට එම දරුවාද නොසිතන්නට ඇත. එම ගසේ ඵල භුක්ති විඳින ශිෂ්‍යත්වලාභීන් එවන ලද ස්තුති පූර්වාත්මක ලිපි කිහිපයක සිංහල පරිවර්තනයන් පහත සඳහන් කරන අතර එම ඵල වල මිහිරි රසය ඒවායින් මොනවට ප්‍රකාශ වනු ඇත.

1. කලා පීඨයේ පළමු වසරේ ඉගෙන ගන්නා මම ආබාධිත ගැහැණු ළමයෙකි. මට ඇවිදීමට නොහැකි අතර අත් දෙකද වැඩ කළ හැකි තත්ත්වයක නැත. මම රෝද පුටුවක් පාවිච්චි කරන අතර අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ උස්ස පෙළ විභාග වලට පෙනී සිටියේ විචිකව පිළිතුරු සැපයීමෙනි. ශ්‍රී ලංකාවේ මෙවැනි ආකාරයකට විභාගයකට මුහුණ දුන් පළමු ශිෂ්‍යාව මම වෙමි. ජේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට මා ලද වරම ගැන ආඩම්බර වන අතර ඔබ තුමන්ලාගේ පරිත්‍යාගය ස්තුති පූර්වකව භාරගතිමි.

2. අද සමාජය ධනය රැස් කිරීමේ තරඟයක යෙදී සිටී. කෙනෙක් තව කෙනෙකුට උදව් කිරීමේ උසස් මිසින් ගුණාංග මිනිසුන්ගේ සිත් තුළින් ක්‍රමයෙන් ඈත් වීගෙන යයි. එවැනි යුගයක් ඔබ වැනි පරිත්‍යාගශීලී පුද්ගලයින් සිටින බව දැනගැනීම මහත් සතුටට කරුණකි.

3. අද දින ඔබ සංගමය මගින් සරසවි ශිෂ්‍යයින්ට ලබාදුන් ශිෂ්‍යත්ව මුදල් ඉතාම සතුටින් භාරගන්නා අතර ඔබ හැමට නොඅඩුව ස්තුති වන්ත වෙමි. මෙම ශිෂ්‍යත්වය මා හට ප්‍රථම වසරේද ලැබුණු අතර අද දින නව ශිෂ්‍යත්වය ලබන විට මා තුන්වන වසරේ පසුවෙමි. මමද මතු දිනයෙක රැකියාවක් ලැබීමෙන් අනතුරුව මම වැනිම ආර්ථික අපහසුකම් ඇති ශිෂ්‍යයින්ට උදව් කිරීමට අද දින අදිටන් කර ගතිමි.

4. මම දෙවන වසරේ වෛද්‍ය ශිෂ්‍යයෙක් වන අතර මගේ අරමුණ කවදා හෝ හොඳ වෛද්‍යවරයෙක් වී අසරණ රෝගීන්ට උදව් කිරීමයි. ඔබ සංගමයේ පරිත්‍යාගය නිසා මුදල් අපහසුකම් ගැන නොසිතා මගේ ඉල්ලකය කරා යාමට මට හැකිවනු ඇත. යම් දිනෙක මමද ඔබ සැම අනුගමනය කරමින් දුප්පත් සිසුන්ට උදව් කිරීමට අධිටන්කරමි.

5. ඔබ තුමන්ලාගේ අවධාරයට බෙහෙවින්ම ස්තුති වන්ත වෙමි. මගේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට මෙය විශාල අත්වැලක් වේ. මා වැනිම දුප්පත් සිසුන් තෝරාගෙන ඔබ තුමන්ලා මේ කරනයේ මහඟු පුණ්‍යකර්මයකි. අපේ අම්මා වගේම හැම අම්මෙක් තාත්තෙක්ම සර්ලාට පින් දෙනවා ඇති. දැනට දෙවනි වසරේ පසුවන නිසා හොස්ටල් පහසුකම් නැත. බෝඩිම් කාමරයකට රු. 2500 ක් ගන්නවා මාසයකට. උයන්න පහසුකම් නැති නිසාත් ඒ සඳහා ඉඩ නොදෙන නිසාත් කෑම කඩෙන් කන්න සිදු වෙනවා. මහපොළින් ලැබෙන මුදලින් මේ සියලු වියදම් පියවා ගන්න බැහැ. ඒ නිසා මේ මුදල මට ගොඩක් වටිනවා. ඔබ තුමන්ලා ඇතුලු මේ පින්කමට දායක වෙන සෑම කෙනෙකුටම සිතූ පැතූ සම්පත් ලැබෙන්න කියා මම බුදුන් වැද ප්‍රාර්ථනා කරනවා.

6. මා උපතින්ම ආබාධිතයෙකි. මගේ අපහසුතා සොයා බලා දිවි ගැන්වීමක් වශයෙන් මෙම ශිෂ්‍යාධාර මුදල මා හට පරිත්‍යාග කිරීම පිළිබඳව අතිශයින් සතුටට පත්වෙමි. 2015 මැයි හත්වන දින මෙම මුදල් ලැබුණු බව දන්වා සිටින්නේ හද පිරි සතුටිනි.

ශිෂ්‍යත්ව ලාභීන්

අප වෙත සිය ගණනින් ප්‍රතිචාර තවමත් ගලා එන අතර ඉහත දැක්වූයේ තෝරාගත් කීපයක සිංහල පරිවර්තනයි. ශිෂ්‍යත්වලාභීන්ගේ පපු කුහරයෙන් නිර්වාජ්‍යව පැන නැගෙන හැඟීම් ඒ ආකාරයෙන්ම පරිවර්තනය කළ වචන පෙළකින් දැනේද යන්න සැක සහිතය. එහෙත් මෙම පණිවිඩ කියවන දැනට උදව් කළ අයට ඇසට කඳුළක් නැගීම වැළැක්විය නොහැකි බවත් ඉදිරියට උදව් කිරීමට බලාපොරොත්තු වන අයට මෙය මහඟු ධෛර්යයක් වනු බව නිසැකය.

ජේරාදෙණිය සරසවි විද්‍යාර්ථයින්ගේ වික්ටෝරියානු ශාඛාව ඔවුන්ගේ දරු දැරියන්ගේද ආධාර ඇතිව රෝපණය කරන ලද මේ වටිනා වෘක්ෂය චණ්ඩ කුණාටු ආදී ස්වභාවික විපත් වලින් ආරක්ෂා කරගැනීමේ මහඟු කාර්යය ඉදිරි පරපුරට භාරව ඇත. එම වෘක්ෂය ජලය පොහොර දමා තවදුරටත් එහි මහ මුල් වර්ධනය කළ යුතුව ඇත.

මේ වසරේ සැප්තැම්බර් මස 6 වන දින පියවරුන්ගේ දිනයේදී තවත් මෙවැනිම ආධාර කළ හැකි අවස්ථාවක් ඔබ හැමට සැලසෙනු ඇත.

දිනය : 06.09.2015
වේලාව : පෙ.ව. 11.30
ස්ථානය : ශාන්ත සයිමන්ස් පැරිශ් ශාලාව
St. Simon's Parish Hall
Taylors Lane, Rowville

ඔබ හැම දෙනටම අප සමඟ එකතු වී රසවත් ආහාර වේලක් භුක්ති විඳ ක්‍රීඩා වලටද සහභාගී වී ප්‍රීති වී උසස් පුණ්‍යකර්මයකට සහභාගීවීමට කරන කාරුණික ආරාධනයයි මේ.

Web link : http:/vic.peradeniya.com.au/projects
E-mail : scholarships.puaavic@peradeniya.com.au

PUAA Vic ශිෂ්‍යත්ව උපකමිටුව

ඩී. බී. කුරුප්පු විසින් මෙතෙක් පළකර ඇති
සියලු ම පොත්,
පහත සඳහන් ස්ථානයෙන්
දැන් ඔබට මිල දී ගත හැක

Taprobane Books & Gifts
Tel: 0409 077 420

එම පොත් වලින් කිපයක් පහත සඳහන් කර ඇත:
සන්නවේදන සංක්‍රාන්තිය (2015)
මැංචෝසන් චාරිකා - (1963, 1991, 2005)
දැත්තගෙයි, යාළුවන්ගෙයි හපන්කම් (1965, 2003)
බක්මහ උළෙන (1975)
පිළිකා සුවය ඔබ අතමය (1990, 2008)
ලංකාව වගේ පුංචි (1998)%
හිර්මාණ චිත්ත රූප (1999)
සිංගරු සිරිත (2001)
විජ්ලවය ආවොත් (2002)
දත්තා හඳට යයි (2004)
එක්තරා ප්‍රේම කතාවක් (2006)
මඟ හොඳට තිබුණොත් (2011)
සුමුදු බොදු බවුන් මඟ (2012)
සිංගරු සිරිත (නව පිටපත) 2013)
සංසාර ගමන (2013
පෙම පමණයි සැබෑ වන්නේ (2015)